**ORIGINAL**

# කොළඹ මහා නගර සභාව

## කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා ලංසු කැඳවීම - 2022.

CPD/21/1400/2022

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

රිසිට් පත් අංකය :- ..........................................................................................

ගමනාන්තය :- ..........................................................................................

සැපයුම්කරුගේ නම :- ..........................................................................................

බස් රථ අංකය :- ..........................................................................................

**ORIGINAL**

# පටුන


1. ලංසු ආරාධනා පත ........................................ (02-03)

2. උපදෙස් සහ කොන්දේසි පත්‍රිකාව ........................................ (04-06)

3. ලංසු තොරතුරු පත්‍රිකාව ........................................ (07-08)

4. ටෙන්ඩර් පෝරමය ........................................ (09)

5. මිල ගණන් ඉදිරිපත් කිරිමේ අයදුම්පත ........................................ (10-14)

6. ටෙන්ඩරයේ අඩංගු වියයුතු ලියවිලි ........................................ (15)

**ORIGINAL**

# කොළඹ මහා නගර සභාව

කොළඹ මහා නගර සභාවේ සේවය කරනු ලබන කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි බස් රථ ධාවකයින්ගේ ලංසු කැඳවීම.
2022 වර්ෂය සඳහා.

කොළඹ 07, පුරහල, මහා නගර සභාව, මධ්‍යම ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා පහත සඳහන් මාර්ග ඔස්සේ රාජකාරි දිනවල උදේ සවස ප්‍රවාහන පහසුකම් සලසා ගැනිමට 2010 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂවල ලියාපදිංචි කළ වායු සමීකරණ රහිත බස් රථ සඳහා සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංක | බස් රථය | ගමන් මාර්ගය |
|---|---|---|
| 1. | පුරහල සිට හොරණ (37 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට, කැස්බෑව, කහතුඩුව, පොකුණුවිට, හොරණ |
| 2. | පුරහල සිට මොරොන්තුඩුව (38KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කොහුවල, බොරලැස්ගමුව, පිළියන්දල, කැස්බෑව, කිදෙල්පිටිය, බණ්ඩාරගම, මොරොන්තුඩුව |
| 3. | පුරහල සිට දොම්පෙ (42 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට පැලියගොඩ, කැළණිය, බියගම, දෙල්ගොඩ, දොම්පේ |
| 4. | පුරහල සිට ඉඹුල්ගොඩ (33 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට පැලියගොඩ, කැළණිය, කිරිබත්ගොඩ, කඩවත, කිරිල්ලවල, ඉඹුල්ගොඩ |
| 5. | පුරහල සිට මිනුවන්ගොඩ (42 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට වත්තල, මාබෝල, මහබාගේ, ජාඇල, ඒකල, කොටුගොඩ, මිනුවන්ගොඩ |
| 6. | පුරහල සිට අවිස්සාවේල්ල (38KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට මරදාන, කොලොන්නාව, වැල්ලම්පිටය, හංවැල්ල පහත්ගම, කලුඅග්ගල, කොස්ගම, අවිස්සාවේල්ල |
| 7. | පුරහල සිට නිට්ටඹුව (43 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට පැලියගොඩ, කැළණිය, කිරිබත්ගොඩ, කඩවත, බැළුම්මහර, මහවිට, යක්කල, කළගෙඩිහේන, තිහාරිය නිට්ටඹුව |
| 8. | පුරහල සිට පාදුක්ක (35 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට රාජගිරිය, අතුරුගිරිය, හබරකඩ, පනාගොඩ, ගොඩගම, මීගොඩ, පාදුක්ක |
| 9. | පුරහල සිට කළුතර (42 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කොල්ලුපිටිය, බම්බලපිටිය, වැල්ලවත්ත, දෙහිවල, රත්මලාන, මොරටුව, පානදුර, කළුතර |

| | | |
|---|---|---|
| 10. | පුරහල සිට කටුබැද්ද (27 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කොල්ලුපිටිය, බම්බලපිටිය, වැල්ලවත්ත, දෙහිවල, රත්මලාන, මොරටුව, කටුබැද්ද |
| 11. | පුරහල සිට පහත්ගම (35 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, මහරගම, කොට්ටාව හෝමාගම ගොඩගම පහත්ගම |
| 12. | පුරහල සිට පිළියන්දල (16 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කිරුළපන, කොහුවල, බොරලැස්ගමුව, පිළියන්දල |
| 13. | පුරහල සිට කොට්ටාව (18 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, මහරගම, කොට්ටාව |
| 14. | පුරහල සිට කඩවත (19 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කිරිබත්ගොඩ, මහර, කඩවත |
| 15. | පුරහල සිට කඩුවෙල (17 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට රාජගිරිය, බත්තරමුල්ල, කොස්වත්ත, මාලබේ, පිට්ටුගල, කඩුවෙල |

01) මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් **2022 අගෝස්තු 19** දින සිට **2022 සැප්තැම්බර් 07** වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා එක් අයදුම්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන රු. 5,600.00 ක් සහ ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු ගාස්තු ලෙස රු 50,000.00 ක්, කොළඹ 07, පුරහල පිහිටි කොළඹ මහා නගර සභා නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ සරප් අංශය වෙත ගෙවීමෙන් පසු ලබා ගන්නා රිසිට් පත කොළඹ මහා නගර සභාවේ මධ්‍යම ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු අයදුම්පත් කට්ටලය ලබා ගත හැක. එසේම අයදුම්පතේ මුල් පිටපත සමඟ ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදල ගෙවනු ලැබූ ලදුපතේ ඡායා පිටපතක්ද අමුණා එවිය යුතුය.

02) මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කල යුතුය. මුල් පිටපත සහ අනු පිටපත යන්න ලියුම් කවරයේ වම්පස සටහන් කර, වෙන වෙනම ලියුම් කවර දෙකක බහා, එම ලියුම් කවර දෙක 10*4 ප්‍රමාණයේ ලියුම් කවරයක බහා,නාගරික කොමසාරිස් කොළඹ, මහා නගර සභාව, පුරහල, කොළඹ 07යන ලිපිනයට **2022 සැප්තැම්බර් 08** දින පෙ.ව.10.00ට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිම හෝ නාගරික ලේකම් දෙපාර්තාමේන්තුව වෙත ගෙනවිත් භාරදීම කල යුතුය. ලංසු බහාලු කවරයේ වම්පස ඉහළ කෙළවරේ "කොළඹ මහා නගර සභා කාර්ය මණ්ඩල ප්‍රවාහනය සඳහා ලංසු කැඳවීම - 2022" යනුවෙන් සඳහන් කළ යුතුය.

අත්සන

## ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා වලංගු කොන්දේසි හා උපදෙස්.

### කොන්දේසි

1. මෙම මාදිලියේ සැපයුම් /සේවා පිළිබඳ පලපුරුද්ද සමග ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතික සහිත සැපයුම්/ සේවා ලබා දෙන්නන් මෙයට ඉල්ලුම් කල හැකිය.
2. සේවාව ලබා ගැනීමට අපේක්ෂිත කාල සීමාව වසර දෙකක් වේ. සතියේ වැඩ කරන දිනයන්හීදී (සෙනසුරාදා, ඉරිදා සහ අනෙකුත් රජයේ නිවාඩු දිනයන්හි හැර) සේවාව ලබා දිය යුතු වේ. එසේ වුවද අවශ්‍ය විටකදී නාගරික කොමසාරිස් මගින් කරනු ලබන දැන්වීමකදී සේවාව ලබා දිය යුතුවේ.
3. ලංසු ඉදිරිපත් කරන පුද්ගලයා හෝ ආයතනය නමින් වාහනය ලියා පදිංචි කර තිබිය යුතුය. ( ඒ බව සනාථ කිරිම සඳහා මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් සාමදාන විනිසුරු හෝ බලයලත් නිලධාරියෙකු වෙතින් සහතික කර ගෙන ඉදිරිපත් කල යුතුය.)
4. ඉල්ලුම් කරනු ලබන බස් රථ 2010.01.01 දින හෝ ඉන් පසු ලියාපදිංචි කරනු ලැබූ බස් රථ පමණක් විය යුතුය.
5. ලංසු තොරතුරු පත්‍රිකාවේ සඳහන් ආසන සංඛ්‍යාවට වඩා බස් රථයේ ආසන සංඛ්‍යාව අඩු නොවිය යුතුය. ඊට වඩා වැඩි ආසන සංඛ්‍යාවක් සහිත බස් රථ සඳහා ප්‍රමුඛත්වය දෙනු ඇත.
6. බස් රථයේ ගමන් ගන්නා මඟින්ගේ ජීවිත අවදානම ආරක්ෂණ සහතිකය මඟින් සම්පූර්ණයෙන්ම ආවරණය විය යුතුය. (අසීමිත රක්ෂණ අවාරණයක් විය යුතුය)
7. ප්‍රදාන ලිපියේ  සිට දින 07 කට පසු එලබෙන දිනයක් කොන්ත්‍රාත්තු ආරම්භක දිනය ලෙස නාගරික කොමසාරිස් විසින් ලිඛිතව දන්වනු ලබයි.
8. තෝරාගත් සාර්ථක ලංසු කරුවන් විසින් ප්‍රධාන ලිපියේ දින සිට දින 07ක් ඇතුලත එක් ගමන් වාරිකයක්(එක් බසයක්) සඳහා රු.300,000/= ක බැගින් වන වටිනාකමට සරිලන කාර්ය සාධන බැදුම්කරයක් ලබා දිය යුතු වේ. එම කාර්ය සාධන බැදුම්කරය කොළඹ මහ නගර සභාවේ මුදල් තැන්පතුවක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ඉදිරිපත් කරනු ලබන බැදුම්කරයක් විය යුතුය.
9. තෝරාගත් සාර්ථක ලංසු කරුවන් අදාල බස් රථයේ අදායම් බලපත්‍රය, යෝග්‍යතා සහතිකය, අසීමිත රක්ෂණ සහතිකය, රියදුරුගේ රියදුරු බලපත්‍රය සහ වෛද්‍ය සහතික යන සහතික පත්‍රයන්හි මුල් පිටපත් ගිවිසුම් ගත වීමට පෙර ලබාදිය යුතුය.
10. තෝරාගන්නාලද සාර්ථක සැපයුම්කරුවන් ප්‍රධාන ලිපිය අනුව නියමිත කාලය තුල  කාර්ය සාධන බැදුම්කරයක් ලබා දිය යුතු අතර කොළඹ මහ නගර සභාව ගිවිසුමට දින 14 ක් ඇතුලත එලබිය යුතු වේ. එසේ කිරීමට අපොහොසත් වන ලංසු කරුවන් විසින් කරනු ලැබූ රු 50,000.00 ක ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතුව කොළඹ මහා නගර සභාව වෙත පවරා ගනු ලබන අතර අතර වසර තුනක් යන තෙක් මෙම කාර්යාල ප්‍රවාහන සේවාව සඳහා අයදුම් කල නොහැක.

11. සෑම මසකම පළමු සතිය තුල, පෙර මාසය උදෙසා බිල්පත, ධාවන වේලා සටහන් සමඟ ඉදිරිපත් කල දින සිට වැඩකරන දින 11කට (එකොලහ) පසුත්, වැඩකරන දින 15 කට (පහලොව) පෙරත් ගෙවීම් කටයුතු සිදුකරනු ඇත.
12. සැපයුම්කරුගේ ක්‍රියා කලාප හේතුවෙන් කොළඹ මහා නගර සභා පරිශ්‍රයේ දේපළකට හානියක් සිදුවුවහොත් හා/හෝ සේවාව අඛණ්ඩව පවත්වාගෙන නොයාම හේතුවෙන් යම් පාඩුවක් හෝ හානියක් සිදුවුවහොත් එකී අලාභය කොළඹ මහා නගර සභාව වෙත ගෙවිය යුතුය. එසේ නොගෙවන අවස්ථාවකදී සැපයුම්කරු වෙත ගෙවීමට නියමිත දෛනික සේවා ගාස්තුවෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.
13. බස් රථය සඳහා ඉන්ධන සේවක වියදම් හා නඩත්තු වියදම් සැපයුම්කරු වි ලබාදිය යුතුය.
14. වලංගු රියදුරු බලපත්‍රයක් සහිත මනා සෞඛ්‍ය තත්වයකින් යුත් විනයගරුක රියදුරකු සේවයේ යෙදවිය යුතුය. මඟින් ප්‍රවාහනය කරන බලපත්‍රයක් (P.T. License) ලබා තිබෙන රියදුරෙකු යෙදවීම වඩා යෝග්‍ය වේ. ඔහු අපරක්ෂාකාරිව ධාවනයක යෙදීම, ආචාරශීලි නොවීම සහ යම් කිසි විනය විරෝධි ක්‍රියාවක් සඳහා චෝදනා ඉදිරිපත්වේ නම්, ඒ සම්බන්ධයෙන් සොයා බලා රියදුරු ඉවත්කිරිමට ක්‍රියා කල යුතුය.
15. බස් රථයේ රියදුරු ඉවත් කර නව රියදුරෙකු සේවයේ යොදවන්නේ නම් ඒ පිළිබඳව පූර්ව අනුමැතිය නාගරික කොමසාරිස්ගෙන් ලබා ගත යුතුය.
16. බස් රථයේ සේවාවන් සහ ධාවනයට අත්‍යවශ්‍ය නොවන නඩත්තු කටයුතු රාජකාරි වේලාවෙන් පරිබාහිරව සිදුකර ගත යුතුය.
17. හදිසි ආපදා අවස්ථාවකදි අනුමත බස් රථය සේවයේ යෙදවීමට නොහැකි විටදි සාමාන්‍ය පහසුකම් ඇති අවශ්‍ය ධාරිතාවයක් සහිත බස් රථයක් සේවයේ යෙදවිය යුතුය. කලින් හඳුනාගනු ලබන ආපදා තත්වයන් හේතුවෙන් බස් රථය සේවයේ යෙදවීමට නොහැකි අවස්ථාවලදි නාගරික කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබා ගෙන වෙනත් බස් රථයක් සේවයේ යෙදවීමට කටයුතු කල යුතුය. එසේ ධාවනය කරන විකල්ප බස් රථය, ධාවනය කල හැකි කාල සීමාව උපරිම දින 14 කට යටත්වේ.
18. කොළඹ මහා නගර සභා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කරනු ලබන රාජකාරි දිනයන්හි මඟින් ප්‍රවාහනය සඳහා බස් රථය යොදා නොගත යුතුය.
19. ගමන් කරන කාර්යාල සේවකයින්ට අමතරව නාගරික ලේකම් කාර්යාලය මඟින් අවසර නොදුන් කිසිදු මඟියෙකු ඇතුලත් කර නොගත යුතුය.
20. කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් හෝ ඔහුගේ නියෝජිතයෙකු දැනුම් දුන් අවස්ථාවේ යෝජිත බස් රථය පරික්ෂා කිරිමට අවස්ථාව සලසා දිය යුතුය.
21. බස් රථයේ රියදුරු විසින් පෙ.ව. 8.15 ට පෙර කාර්යාලය වෙත පැමිණිමට හා ප.ව. 4.30 ට කාර්යාල පරිශ්‍රයෙන් පිටත් විමට කටයුතු කල යුතු අතර පැමිණිමෙන් පසු සහ පිටත්වීමට පෙර ආරක්ෂක අංශයේ තබා ඇති ලේඛණය අත්සන් කල යුතුය.
22. ලංසු ලියකියවිලි ඇතුළත් සෑම පිටුවකටම ලංසුකරු විසින් අත්සන් යොදා තිබිය යුතුය.

23. ඩීසල් මිල අඩු හෝ වැඩි විමකදි ගෙවීම් කටයුතු පහත සමීකරණය මත රඳා පවතියි. එහිදි ආසන 42 ක සහ ඊට වැඩි බස් රථ සඳහා ඩීසල් ලිටරයකින් ධාවනය කල හැකි දුර කිලෝමීටර් හතරක් (04) ලෙසද, ආසන 42ට අඩු බස් රථ සඳහා ඩීසල් ලිටරයකින් ධාවනය කල හැකි දුර කිලෝමීටර් හයක් (06) ලෙස සලකනු ලැබේ.

| | |
|---|---|
| දෛනික ගෙවීම අඩුවීම/වැඩිවීම | = (වර්තමාන ඉන්ධන මිල - ලංසු කැඳවන ආරම්භක දිනයේ ඉන්ධන මිල) / ඩීසල් ලිටරයකින් ධාවනය කල හැකි දුර X දිනයකදි ධාවනය කරනු ලබන දුර |

24. සෑම දිනකම බස් රථය ධාවනයට පෙර විෂබීජහරණයට ලක්කල යුතු අතර එය ධාවනයට පත් කිරිමේදි යෝග්‍ය තත්වයෙන් පැවතිය යුතුය.
25. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල් විසින් වරින් වර නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකුලව සේවා සැපයිය යුතුය.
26. ගිවිසුම් ගත කාලයට පෙර දෙපාර්ශවයෙන් කවර පාර්ශවයකට හෝ සේවාව අවසන් කිරිමට අවශ්‍ය වේ නම් ඒ බව ලිත් මාසයකට පෙර පුර්වයෙන් දැනුම් දිය යුතුය. බස් රථයේ ගමන් කරන මඟින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් මතු වුවහොත් පුර්ව දැනුම් දිමකින් පසු සේවා සැපයුම්කරුවන්ගේ සේවය අවසන් කිරිමට කටයුතු කල යුතුය.
27. අයදුම්කරුවන් හට එක් මාර්ගයක් හෝ සියලු මාර්ග සඳහා අයදුම්පත් ඉදිරිපත් කල හැකි අතර, එක් ලියාපදිංචි අංකයක් සහති බස් රථයකින් එක් ගමන් මාර්ගයක් සඳහා පමණක් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.
28. සමාගමක් හෝ ලියාපදිංචි ව්‍යාපාරයක් විසින් අයදුම් කරන්නේ නම් ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කල ඡායා පිටපතක් ඉදිරිපත් කල යුතුය.
29. ඉහතින් දක්වා ඇති කොන්දේසි වලට අනුකුල නොවි රාජකාරි සඳහා යොදවන බස් රථ සේවයෙන් ඉවත් කිරිමට කටයුතු කරනු ඇත.

<u>**උපදෙස්**</u>

1. ප්‍රවාහන පහසුකම් සැපයිමට යෝජිත බස් රථයට අමතරව කොපමණ බස් රථ ප්‍රමාණයක් ලංසු ඉදිරිපත් කරන්නා සතුද යන වගත් ඒ පිළිබඳ වර්ගය, මාදිලිය, හා ආසන සංඛ්‍යාව ආදි විස්තර ඉදිරිපත් කල යුතුය.
2. බස් රථයේ ධාවන සේවාවන් හා ටයර් මාරු කිරිම් රාජකාරි සඳහා බාධාවක් නොවන අයුරින් ඉටුකර ගත යුතුය.
3. ඉදිරිපත් කරන වාහනයේ කොපමණ මගින් ප්‍රවාහනය කල හැකිදැයි සටහන් කල යුතුය.

**<u>ලංසු තොරතුරු පත්‍රිකාව</u>**

ප්‍රධාන ගණකාධිකාරි,
මධ්‍යම ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව,
කොළඹ මහා නගර සභාව,
කොළඹ 07.

ලිපිගොනු අංකය :-

01. කොළඹ 07, පුරහල, කොළඹ මහා නගර සභා පරිශ්‍රය වෙත පහත සඳහන් මාර්ග ඔස්සේ නියමිත ආසන සංඛ්‍යාව හෝ ඊට වැඩි ආසන සංඛ්‍යාවකින් යුත් බස් රථ සඳහා සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවනු ලැබේ.

| අංකය | බස් රථය | ආසන සංඛ්‍යාව | ගමන් මාර්ගය |
|---|---|---|---|
| 01. | පුරහල සිට හොරණ (37 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කැස්බෑව, කහතුඩුව, පොකුණුවිට, හොරණ |
| 02. | පුරහල සිට මොරොන්තුඩුව (38 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කොහුවල, බොරලැස්ගමුව, පිළියන්දල, කැස්බෑව, කිදෙල්පිටිය, බණ්ඩාරගම, මොරොන්තුඩුව |
| 03. | පුරහල සිට දොම්පෙ (42 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට පැලියගොඩ, කැළණිය, බියගම, දෙල්ගොඩ, දොම්පේ, |
| 04. | පුරහල සිට ඉඹුල්ගොඩ (33 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට පැලියගොඩ, කැළණිය, කිරිබත්ගොඩ, කඩවත, කිරිල්ලවල, ඉඹුල්ගොඩ |
| 05. | පුරහල සිට මීනුවන්ගොඩ (42 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට වත්තල, මාබෝල, මහබාගේ, ජාඇල, ඒකල, කොටුගොඩ, මීනුවන්ගොඩ |
| 06. | පුරහල සිට අවිස්සාවේල්ල (38 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට මරදාන, කොලොන්නාව, වැල්ලම්පිටය, හංවැල්ල පහත්ගම, කලුඅග්ගල, කොස්ගම, අවිස්සාවේල්ල |
| 07. | පුරහල සිට නිට්ටඹුව (43 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට පැලියගොඩ, කැළණිය, කිරිබත්ගොඩ, කඩවත, බැළුම්මහර, මහවිට, යක්කල, කළගෙඩිහේන, තිහාරිය නිට්ටඹුව |
| 08. | පුරහල සිට පාදුක්ක (35 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට රාජගිරිය, අතුරුගිරිය, හබරකඩ, පනාගොඩ, ගොඩගම, මීගොඩ, පාදුක්ක |
| 09. | පුරහල සිට කළුතර (42 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කොල්ලුපිටිය, බම්බලපිටිය, වැල්ලවත්ත, දෙහිවල, රත්මලාන, මොරටුව, පානදුර, කළුතර |
| 10. | පුරහල සිට කටුබැද්ද (27 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කොල්ලුපිටිය, බම්බලපිටිය, වැල්ලවත්ත, දෙහිවල, රත්මලාන, මොරටුව කටුබැද්ද |
| 11. | පුරහල සිට පහත්ගම (35 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, මහරගම, කොට්ටාව හෝමාගම ගොඩගම පහත්ගම |
| 12. | පුරහල සිට පිළියන්දල (16 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කිරුළපන, කොහුවල, බොරලැස්ගමුව, පිළියන්දල |
| 13. | පුරහල සිට කොට්ටාව (18 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, මහරගම, කොට්ටාව |
| 14. | පුරහල සිට කඩවත (19 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කිරිබත්ගොඩ, මහර, කඩවත |
| 15. | පුරහල සිට කඩුවෙල (17 KM) | 54 හෝ ඊට වැඩි | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට රාජගිරිය, බත්තරමුල්ල, කොස්වත්ත, මාලබේ, පිට්ටුගල, කඩුවෙල |

02. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.
03. ලංසු අවසන් කරන දින සිට දින 91ක් දක්වා ලංසු කාලය වලංගු විය යුතුය.
04. ලංසු ලියකියවිලි ඇතුළත් සෑම පිටුවක්ම ලංසුකරු විසින් අත්සන් යොදා තිබිය යුතුය. සාමාගමක් තම නිල මුද්‍රාව තබා අත්සන් කල යුතුය.
05. කොළඹ මහා නගර සභාවේ මධ්‍යම ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව තුලදී කිසිදු ගෙවීමකින් තොරව කාර්යාල වේලාව තුලදී ලේඛණ පරීක්ෂා කළ හැක.
06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසු කරුවන් **2022 අගෝස්තු 19** දින සිට **2022 සැප්තැම්බර් 07** දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව. 3.00 දක්වා එක් අයදුම්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන රු 5600.00 ක් සහ ආපසු ගෙවනු තබන ඇප තැන්පතු ගාස්තු ලෙස රු 50,000.00 ක් කොළඹ මහා නගර සභාවේ සරප් අංශය වෙත ගෙවීමෙන් පසු ලබාගන්නා රිසිට් පත කොළඹ මහා නගර සභාවේ මධ්‍යම මිලදී ගැනීම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු අයදුම්පත් කට්ටලයක් ලබා ගත හැක. එසේම අයදුම්පතේ මුල් පිටපත සමඟ ආපසු ගෙවන ඇප තැන්පතු මුදල ගෙවනු ලැබු ලදුපතේ ඡායා පිටපතක්ද අමුණා එවිය යුතුය.
07. මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කල යුතුය. මුල් පිටපත සහ අනු පිටපත යන්න ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ සටහන් කර වෙන වෙනම ලියුම් කවර දෙකක බහා, එම ලියුම් කවර දෙක 10*4 ප්‍රමාණයේ ලියුම් කවරයක බහා **2022 සැප්තැම්බර් 08** දින පෙ.ව 10.000 ට පෙර නාගරික කොමසාරිස් කොළඹ, මහා නගර සභාව, පුරහල, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ නාගරික ලේකම් දෙපාර්තාමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කල යුතුය. ලංසු බහාලුම් ලියම් කවරයේ වම්පස ඉහල කෙළවරේ "කොළඹ මහා නගර සභා කාර්ය මණ්ඩල ප්‍රවාහනය 2022/2024" යනුවෙන් සඳහන් කල යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම එකී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හා ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගි විය හැක.
08. තෝරා ගත් සැපයුම්කරු කොළඹ මහා නගර සභවේ නාගරික කොමසාරිස් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.
09. ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබාදී ඇති කාලය දීර්ඝ කිරීම සඳහා කිසිදු අයුරිකින් සලකනු නොලබන අතර තැපැලේදී ඇතිවන ප්‍රමාදවීම් කොළඹ මහා නගර සභාව වගකියනු නොලැබේ.
10. මෙහි සඳහන් උපදෙස් වලට අනුකූලතාවයට නොදක්වන ඕනෑම ටෙන්ඩරයක් ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
11. මෙම ටෙන්ඩරය ඕනෑම අවස්ථාවකදී අවලංගු කිරීමේ බලය ප්‍රසම්පාදන කමිටුව සතුය.
12. වැඩිදුර විස්තර සඳහා කාර්යාල වේලාව තුලදී දුරකථන අංක 011-2686369/2686389 මඟින් කොළඹ මහා නගර සභාවේ මධ්‍යම ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ ගණකාධිකාරී ඇමතිය යුතුය.

ප්‍රසම්පාදන කමිටුව

කොළඹ මහා නගර සභාව

කොළඹ 07

## ටෙන්ඩර් පෝරමය (From Of Bid)

ප්‍රධාන ගණකාධිකාරි,
මධ්‍යම ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව,
කොළඹ මහා නගර සභාව,
කොළඹ 07.
(සටහන:- ලංසු ලේඛනය නිකුත් කිරීමට ප්‍රථම, (*) සලකුණ දක්වා ඇති සියළුම හිස්තැන් සේවායා විසින් නියමිත පරිදි පිරවිය යුතුය.)

කොන්ත්‍රාත්තුවේ නම :- කොළඹ මහා නගර සභා කාර්ය මණ්ඩල ප්‍රවාහනය
නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව, වෙතට
(ලිපිගොනු අංකය)
මහත්මයාණෙනි,

1. පහත අත්සන් කරන මම/අපි ඉහත සඳහන් කාර්යය ඉටුකිරීම සඳහා සියලු කොන්දේසි , උපදේස් හා ලංසු තොරතුරු පත්‍රිකාව, පරීක්ෂා කිරීමෙන් අනතුරුව. එම කාර්ය ඉහත සඳහන් කොන්ත්‍රාත් කොන්දේසි, සංශෝධන අනුව ශ්‍රී ලංකා මුදලින් * රු. .................................................................. (VAT රහිතව) (රු. ........................................) (VAT රහිතව) හෝ ඉහත කී කොන්දේසි වලට අනුකූලව තීරණය කරනු ලබන වෙනත් මුදලකට ඉටු කිරමට පොරොන්දු වන්නේමි/වන්නෙමු.
2. මගේ/අපගේ ටෙන්ඩරය පිළිගතහොත් 2022.10.01 සිට කාර්ය ආරම්භ කිරීමටත් , 2024.09.30 දින දක්වා කාල සීමාව තුල කොන්ත්‍රාත්තුවට අදාල මුළු සේවා සැපයීමටත් මම/අපි පොරොන්දු වෙමි/වෙමු.
3. ලංසු තොරතුරු පත්‍රකාවේහි 3 වන වගන්තියේ සඳහන් කාල සීමාව තුල මෙම ටෙන්ඩරය වෙනුවෙන් මම/අපි බැදි සිටිමට එකඟ වන අතර එම කාල සීමාව ඉකුත් විමට පෙර ඕනෑම අවස්ථාවක මෙම ටෙන්ඩරය භාර ගැනිමට පොරෝන්දු වෙමි/වෙමු.
4. විධිමත් ගිවිසුම පිළියල කොට ඊට එළඹෙන තෙක් මෙම ටෙන්ඩරය සහ ඔබගේ ලිඛිත පිළිගැනිමේ ලිපිය මඟින් ඔබ හා අප අතර නෛතික බැඳිමක් ස්ථාපිත කෙරෙන බව මම/අපි පිළිගනිමි/මු.
5. අවම ටෙන්ඩරය පිළිගැනිමට හෝ ඔබ වෙත ලැබෙන ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනිමට හෝ ඔබ බැඳි නොසිටින බව මම/අපි දනිමි/දනිමු.
6. ........................................................................................ වෙනුවෙන් ටෙන්ඩරය අත්සන් කිරිමට .............................................................................. වශයෙන් යථා පරිදි බලයලත් වර්ෂ 2022....... ක්වූ .............................. මස ........................................ දිනදිය.

අත්සන :- ..........................................................

ලිපිනය :- ..........................................................

සාක්ෂි :- ..........................................................

**ORIGINAL**

# කොළඹ මහා නගර සභා කාර්ය මණ්ඩල ප්‍රවාහනය සඳහා ලංසු කැඳවීම.

## 2022 වර්ෂය සඳහා අයදුම් පත.

**වාහනයේ ලියාපදිංචි අයිතිකරු පිලිබඳ තොරතුරු :-**

| | | |
|---|---|---|
| 1 | ප්‍රවාහන පහසුකම් සපයන ආයතනයේ / පුද්ගලයාගේ නම | |
| 2 | ලිපිනය | |
| 3 | හැඳුනුම්පත් අංකය | |
| 4 | ග්‍රාම නිලධාරි වසම | |
| 5 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | |
| 6 | දිස්ත්‍රික්කය | |
| 7 | දුරකථන අංකය | |
| 8 | විද්‍යුත් තැපැල | |
| 9 | ෆැක්ස් | |
| 10 | VAT ලියාපදිංචි වී ඇති අංකය | |
| 11 | අයදුම්පත් ගාස්තු ගෙවූ ලදුපත් අංකය(පිටපතක් ඇමිණිය යුතුය) | |
| 12 | ඇප තැන්පත් ගාස්තු ගෙවූ ලදුපත් අංකය(පිටපතක් ඇමිණිය යුතුය) | |

**(පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය ඇමිණිය යුතුය)**

**ORIGINAL**

| | | | වාහනය පිළිබඳ විස්තර | | | | | | දෛනික ගාස්තුව - **ඉලක්කමෙන් VAT** **බදු රහිතව** | දෛනික ගාස්තුව -**අකුරින් VAT** බදු රහිතව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාහන වර්ගය | වාහන මාදිලිය | වාහනයේ ආසන සංඛයාව | වාහන අංකය | නිෂ්පාදිත වර්ෂය | ලියාපදිංචි වර්ෂය | | |
| 1. | පුරහල සිට හොරණ (37 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට, කැස්බැව, කහතුඩුව, පොකුණුවිට, හොරණ | | | | | | | | |
| 2. | පුරහල සිට මොරොන්තුඩුව (38KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කොහුවල, බොරලැස්ගමුව, පිළියන්දල, කැස්බැව, කිදෙල්පිටිය, බණ්ඩාරගම, මොරොන්තුඩුව | | | | | | | | |
| 3. | පුරහල සිට දොම්පෙ (42 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට පැලියගොඩ, කැළණිය, බියගම, දෙල්ගොඩ, දොම්පේ | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4. | පුරහල සිට ඉඹුල්ගොඩ (33 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට පැලියගොඩ, කැළණිය, කිරිබත්ගොඩ, කඩවත, කිරිල්ලවල, ඉඹුල්ගොඩ | | | | | | | | |
| 5. | පුරහල සිට මිනුවන්ගොඩ (42 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට වත්තල, මාබෝල, මහබාගේ, ජාඇල, ඒකල, කොටුගොඩ, මිනුවන්ගොඩ | | | | | | | | |
| 6. | පුරහල සිට අවිස්සාවේල්ල (38KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට මරදාන, කොලොන්නාව, වැල්ලම්පිටය, හංවැල්ල පහත්ගම, කලුඅග්ගල, කොස්ගම අවිස්සාවේල්ල | | | | | | | | |
| 7. | පුරහල සිට නිට්ටඹුව (43 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට පැලියගොඩ, කැළණිය, කිරිබත්ගොඩ, කඩවත, බැළුම්මහර, මහවිට, යක්කල, කළගෙඩිහේන, තිහාරිය නිට්ටඹුව | | | | | | | | |
| 8. | පුරහල සිට පාදුක්ක (35 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට රාජගිරිය, අතුරුගිරිය, හබරකඩ, පනාගොඩ, ගොඩගම, මීගොඩ, පාදුක්ක | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 9. | පුරහල සිට කළුතර (42 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කොල්ලුපිටිය, බම්බලපිටිය, වැල්ලවත්ත, දෙහිවල, රත්මලාන, මොරටුව, පානදුර, කළුතර | | | | | | | | | |
| 10. | පුරහල සිට කටුබැද්ද (27 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කොල්ලුපිටිය, බම්බලපිටිය, වැල්ලවත්ත, දෙහිවල, රත්මලාන, මොරටුව, කටුබැද්ද | | | | | | | | | |
| 11. | පුරහල සිට පහත්ගම (32 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, මහරගම, කොට්ටාව හෝමාගම ගොඩගම පහත්ගම | | | | | | | | | |
| 12. | පුරහල සිට පිළියන්දල (16 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කිරුළපන, කොහුවල, බොරලැස්ගමුව, පිළියන්දල | | | | | | | | | |
| 13. | පුරහල සිට කොට්ටාව | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, මහරගම, කොට්ටාව | | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 14. | පුරහල සිට කඩවත (19 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට කිරිබත්ගොඩ, මහර, කඩවත | | | | | | | | |
| 15. | පුරහල සිට කඩුවෙල (17 KM) | පුරහල මහා නගර සභා පරිශ්‍රයේ සිට රාජගිරිය, බත්තරමුල්ල, කොස්වත්ත, මාලබේ, පිට්ටුගල, කඩුවෙල | | | | | | | | |
| එකතුව | | | | | | | | | | |
| එකතුකල VAT | | | | | | | | | | |
| එකතුව VAT සහිතව | | | | | | | | | | |

ඉහත සඳහන් තොරතරු සත්‍ය හා නිවැරදි බව මා ප්‍රකාශ කරමි. මෙම සේවාව සඳහා මා තෝරා ගනු ලබන්නේ නම් අදාල කොන්දේසි හා නියමයන්ට යටත්ව සේවාව විධිමත්ව පවත්වාගෙන යාමට එකඟ වන බව මෙයින් ප්‍රකාශ කරමි.

--------------------------------------------------- ---------------------------------------------------------------

දිනය අයදුම්කරුගේ අත්සන

<u>වෙනත් කරුණු (සැලකිය යුතුයි.)</u>

<u>ටෙන්ඩරයේ අඩංගු විය යුතු ලේඛණය (Check List)</u>

| | | පිටු අංකය | ඉදිරිපත් කර ඇත/නැත |
|---|---|---|---|
| 1. | නිසි අයුරින් පුරවා අත්සන් කරන ලද ටෙන්ඩර් පෝරමය | (09) | |
| 2. | මිල ගණන් යෙදූ ඉල්ලුම් පත්‍රය | (10) | |
| 3. | අනු අත්සන් යෙදූ උපදෙස් සහ කොන්දේසි පත්‍රිකාව | (04/05/06) | |
| 4. | අනු අත්සන් යෙදූ ලංසු තොරතුරු පත්‍රිකාව | (07/08) | |
| 5. | බස් රථය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් | ඡායා පිටපත් අමුණා ඇත. | |
| 6. | ග්‍රාම නිලධාරි සහතිකය | ඇමිණිය යුතුය. | |
| 7. | වැට් (VAT) සඳහා ලියාපදිංචි වී ඇත්නම් ලියාපදිංචි සහතිකයේ පිටපතක් | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |
| 8. | අයදුම්පත්‍ර සහ ඇප තැන්පතු ගාස්තු ගෙවූ ලදුපතෙහි පිටපතක් | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |
| 9. | ව්‍යාපර නාම ලියාපදිංචි සහතිකයේ සහතික කල ඡායා පිටපතක් | ඡායා පිටපතක් ඇමිණිය යුතුය. | |

- මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කල යුතුය. මුල් පිටපත සහ අනු පිටපත යන්න ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කර වෙන වෙනම ලියුම් කවර දෙකක බහා, එම ලියුම් කවර දෙක 10*4 ප්‍රමාණයේ ලියුම් කවරයක බහා, **2022.09.08** දින පෙ.ව**10.00**ට පෙර නාගරික කොමසාරිස් කොළඹ, මහා නගර සභාව, පුරහල, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ නාගරික ලේකම් දෙපාර්තාමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිම කල යුතුය. ලංසු බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ "කොළඹ මහා නගර සභා කාර්ය මණ්ඩල ප්‍රවාහනය 2022/2024" සඳහා ලංසු කැඳවිම යනුවෙන් සඳහන් කල යුතුය.